සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
ஆரம்ப கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF PRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT

මගේ අංකය / எனது இல / My No: DSD/HO/02/Pen - Com
ඔබේ අංකය / உமது இல / Your No: ........................
දිනය / திகதி / Date: 2019.08.24

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත,

**<u>මියගිය හා විශ්‍රාම ගිය නිලධාරින් සඳහා විශ්‍රාම වැටුප් / වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් සකස් කිරීම කඩිනම් කිරීම සම්බන්ධවයි.</u>**

උක්ත කරුණට අදාළ මාගේ අංක DSD/HO/EST/02/02/Pen.Com හා 2019.07.23 දිනැති ලිපියට අමතර වශයෙනි.

02. ඒ අනුව මියගිය හා විශ්‍රාම ගිය මුල්සේවා සමෘද්ධි නිලධාරින් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම් කටයුතු සිදු කිරීමේ දී ඔවුන් විසින් ලබාගත් EPF ගිණුම් ශේෂය අදාළව රාජ්‍ය දායකත්වය වන 60% අය කර ගත යුතු බව හා 2019.04.04 දිනැතිව නිකුත්කරන ලද 03/2019 චක්‍ර ලේඛය මඟින් දැනටමත් ඔබව දැනුවත් කර ඇති අතර මුදල් අයකර ගැනීම සම්බන්ධ ශේෂ තහවුරුව ශ්‍රී ලංකා මහා බැංකුව මඟින් ලබා ගැනීමේ දී නිලධාරින් මහත් අපහසුතාවයට පත්වන බව මා හට නිරීක්ෂණය වී ඇත.

03. එබැවින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ අංශ සමඟ මේ පිළිබඳව සාකච්ඡා කොට එළඹි තීරණ අනුව දෙපාර්තමේන්තුව මඟින් තොරතුරු හා දත්ත ලබා ගැනීමේ වැඩ පිළිවෙලක් සකස් කර ගැනීමට සැළසුම් කර ඇත. මෙම වැඩ පිළිවෙළ අදියර කිහිපයක් යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර එහි පළමු අදියර ලෙස දැනට මිය ගිය සහ විශ්‍රාම ගිය නිලධාරින්ට අදාළ තොරතුරු හා දත්ත ලබා ගැනීමට නියමිතව ඇත. ඒ සඳහා මේ සමඟ ඉදිරිපත් කරනු ලබන ඇමුණුම් අංක 01 අනුව තොරතුරු **2019.08.28** දිනට පෙර it@samurdhi.gov.lk යන විද්‍යුත් ලිපිනයට (E-Mail) යොමු කරන ලෙස දන්වමි.

04. එමෙන්ම ඇමුණුම් අංක 02 අනුව අනෙකුත් සියළුම නිලධාරින්ට අදාළ තොරතුරු **2019.09.20** දිනට පෙර ඉහත විද්‍යුත් තැපැල මඟින් මා වෙත යොමු කළ යුතු බවද කාරුණිකව දන්වමි.

05. තවද අර්ථ සාධක අරමුදල් හිමිකමේ පසු අයිතිය දරුවන්, දෙමාපියන් හෝ වෙනත් පාර්ශ්ව වෙත බෙදී ගිය අවස්ථා වලදී උප්පැන්න සහතික වල මුල් පිටපත් සමඟ පෞද්ගලිකව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අදාළ නිලධාරි හෝ කලත්‍රයා යොමු කළ යුතුය. (මේ පිළිබඳව වැඩි විස්තර සඳහා 011-2872227 අංකයට අමතන්න)

මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සළකමි.

ඒ.එච්.එල්.ඩී.ගාමිණී විජේසිංහ
අධ්‍යක්ෂ (පාලන හා ආයතන)
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | | | | | |
|---|---|---|---|---|---|
| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் (நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |